කොළඹ විශ්ව විද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණ විභාගය 2015-16

(පළමු සෙමෙස්තර අවසාන) -

ECN 1101 : මූලික සූක්ෂම ආර්ථික විද්‍යාව

කාලය පැ දෙකක් (2) පමණි

ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න

---

1. පහත සඳහන් සංකල්ප උචිත ආකාරයට සංඛ්‍යානාත්මක නිදසුන් හා/ හෝ රූපසටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න.

   I. ආන්තික උපයෝගිතාවය

   II. ආවස්ථික පිරිවැය

   III. නිෂ්පාදන හැකියා වක්‍රය

   IV. සෘණ උපයෝගිතාවය

(එක කොටසකට ලකුණු 6. 25)

2. (අ)

| P | $Q_d$ |
|---|---|
| 20 | 100 |
| 60 | 20 |

P යනු මිලයි. $Q_d$ යනු ඉල්ලුම් ප්‍රමාණයයි. ඉල්ලුම් වක්‍රයේ සමීකරණය සොයන්න.

(ලකුණු 4)

සැපයුම් වක්‍රයේ සමීකරණය $Q_s = 20+P$ නම් ඉහත දි ඇති මිලයන්ට අදාළව සැපයුම් ප්‍රමාණයන් දක්වන්න.

(ලකුණු 4)

සමතුලිත මිල හා ප්‍රමාණය සමීකරණ යොදා ගනිමින් ගණනය කරන්න.

(ලකුණු 5)

...ය සපත්තු හා කුඩ වෙළඳපල නම් පහත සඳහන් සිදුවීම් සමතුලිත මිලට හා ප්‍රමාණයට ...න ආකාරය රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

සපත්තු මහන්නන්ට ගෙවන වැටුප් ඉහළ යන විට පාවහන් වෙළඳපල.

වැසි කාලයේදී කුඩ වෙළඳපල.

(එක කොටසකට ලකුණු 4)

"(අ)" කොටසෙහි දි ඇති දත්ත යොදාගනිමින් මිල රුපියල් 20 සිට රුපියල් 60 දක්වා ඉහළ යනවිට මිල ඉල්ලුම් නම්‍යතාවය (ලක්ෂ්‍ය) ගණනය කරන්න.

(ලකුණු 4)

3. (අ) පාරිභෝගික අතිරික්තයක් හට ගැනෙන්නේ මන්ද? මනඃකල්පිත සංඛ්‍යා යොදාගනිමින් පාරිභෝගික අතිරික්තයක් හට ගැනෙන ආකාරය රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

(ආ) නිශ්පාදන අතිරික්තය ඉහළ යන අවස්ථාවකට නිදසුනක් දෙන්න. මෙම තත්ත්වය රූප සටහන් ආධාරයෙන් පෙන්නුම් කරන්න.

(ලකුණු 5)

(ඇ) පහත සඳහන් අවස්ථා වලදී හට ගැනෙන වෙළඳපල බලපෑම් රූප සටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න.

I. රජය පාලන මිලක් නියම කිරීම

II. රජය අවම මිලක් නියම කිරීම

III. රජය භාණ්ඩයක් මත ඒකක බද්දක් නියම කිරීම

(එක කොටසකට ලකුණු 5)

4. (අ) "පුද්ගලයකුගේ ශ්‍රම සැපයුම් රේඛාව ආපස්සට නැවේ." මෙසේ වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5)

(ආ)

I. "කාර්යක්ෂමතා වැටුප් ගෙවීම ශ්‍රමිකයාට හා සමාගමට වාසිදායක වේ."

II. "ඍණාත්මක වැටුප් විභේදනය (Discrimination) ආර්ථික මෙන්ම සාමාජීයව අයහපත්ය".

මෙම කියමන් දෙක විග්‍රහාත්මකව සාකච්ඡා කරන්න.

(එක කොටසකට ලකුණු 7.5)

(ඇ) ප්‍රාග්ධන භාණ්ඩයේ මිල 2016 දී රුපියල් 10000 කි. ජීවන කාලය අවුරුදු 3 යි. මෙම යන්ත්‍රය ආශ්‍රයෙන් 2017 අවුරුද්ද අවසානයේ අපේක්ෂිත ශුද්ධ ආදායම රු:4000: 2018 අවසානයේ දී රු:4000 හා 2019 අවසානයේ දී රු:5000 වේ. වට්ටම් අනුපාතිකය 5% කි. මෙම යන්ත්‍රය ව්‍යවසායකයා මිලදී ගත යුතුද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 5)

5. (අ) පහත දී ඇති වක්‍රයන්ට අදාළව රූප සටහන් උපයෝගී කරගනිමින් "හීනවන ආන්තික ඵලදාව" යන සංකල්පය පැහැදිලි කරන්න.

I. මුලු ඵලදා වක්‍රය

II. අන්තික ඵලදා වක්‍රය

(එක කොටසකට ලකුණු 4)

(ආ) ශ්‍රමිකයන් සංඛ්‍යාව ඉහළ යන විට "හීනවන ආන්තික ඵලදායිතාවය" හට ගැනෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 4)

(ඇ)

I. පහත දී ඇති දත්ත උපයෝගී කරගනිමින් සමාගම තෝරා ගන්නා නිෂ්පාදන ක්‍රමවේදය කුමක්දැයි දක්වන්න.
ප්‍රාග්ධන ඒකකයක මිල රුපියල් 300 කි. ශ්‍රමිකයකු මත දරන වියදම රුපියල් 350 කි.

නිෂ්පාදන ක්‍රමවේදය A යොදා ගන්නේ ප්‍රාග්ධන ඒකක 4 ක් හා ශ්‍රම ඒකක 3 යි.
නිෂ්පාදන ක්‍රමවේදය B යොදා ගන්නේ ප්‍රාග්ධන ඒකක 3 ක් හා ශ්‍රම ඒකක 4 යි.

(ලකුණු 4)

II. කුමන තත්ත්වයක් යටතේ සමාගම විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රමය තොරාගනිද?

(ලකුණු 3)

(ඈ) ශ්‍රමයේ ඵලදායිතාව ඉහළ දැමීමට යොදාගත හැකි ක්‍රම තුනක් යොජනා කරන්න.

(ලකුණු 6)

(අ) පූර්ණ තරගකාරී වෙළඳපලක ලක්ෂණ ලයිස්තුගත කරන්න.

(ලකුණු 5)

(ආ) පහත දක්වා ඇති අවස්ථාවන් රූප සටහනක් මගින් පෙන්වා වෙළඳපලෙහි ඉදිරියෙහි හටගැනෙන තත්ත්වයන් පැහැදිලි කරන්න.

I. මිල තිරණය වන්නේ සාමාන්‍ය මුලු පිරිවැයට ඉහලිනි. (P > ATC)

II. මිල තිරණය වන්නේ සාමාන්‍ය මුලු පිරිවැයට අඩුවෙන් වුවත් සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහළිනි. (AVC < P < ATC)

III. මිල තිරණය වන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයට පහලිනි. (P < AVC)

(එක් කොටසකට ලකුණු 5)

(ඇ) පූර්ණ තරගකාරී වෙළඳපලක සමාගමක් සැපයුම් වක්‍රය තිරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 5)

7. (අ) ආර්ථිකයක ඒකාධිකාර හටගැනෙන ආකාරයන් තුනක් දක්වන්න.

(ලකුණු 6)

(ආ) රූප සටහනක් ආධාරයෙන් ඒකාධිකාරයක

I. නිෂ්පාදන ප්‍රමාණය

II. මිල

තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.

(එක් කොටසකට ලකුණු 4)

(ඇ) අදාල රූප සටහන් ආශ්‍රයෙන් ඒකාධිකාරයට වඩා පූර්ණ තරගකාරී වෙළඳපලක පාරිභෝගික අතිරික්තය වැඩි බව ඔප්පු කරන්න.

(ලකුණු 6)

(ඈ) ඒකාධිනාරය පාලනය කිරීම සඳහා රජයකට යොදාගත හැකි පියවර මොනවාද?

(ලකුණු 5)

8. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (4) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. ආදායම් ඉල්ලුම් නම්‍යතාවය

II. රේඛීය නිශ්පාදන හැකියා මායිම් වක්‍රය

III. සුඛෝපභෝගි භාණ්ඩ හා බාල භාණ්ඩ

IV. කතිපයාධිකාරයේ ලක්ෂණ

V. භූමිය

VI. ව්‍යවසායකත්වය

VII. ප්‍රචාරණය

(එක් කොටසකට ලකුණු 6.25)

**************************